රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 387(v) (34)

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1988 නොවැම්බර් මස 01 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

1988 නව ඒකාබද්ධ වැටුප් - පරිපාලන ප්‍රතිසංස්කරණ කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම - වැටුප් හා සේවක සංඛ්‍යා.
1987 දෙසැම්බර් මස 11 දිනැති අංක.387 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට සංශෝධන

---

1987 දෙසැම්බර් මස 11 දිනැති අංක.387 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය, පහත දැක්වෙන අන්දමට සංශෝධනය කෙරේ.

01. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.387 හි 01 වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කරන්න.

"1986.05.02 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.327 හි දැක්වෙන වැටුප් පරිමාණ වෙනුවට මෙම චක්‍රලේඛයේ 4 වැනි ඡේදයේ සඳහන් විධිවිධානවලට යටත්ව, මෙහි දක්වා ඇති 1988 නව ඒකාබද්ධ වැටුප් පරිමාණ, 1988 ජනවාරි මස 01 වෙනි දින සිට ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත. එහෙත් මෙහි II පරිශිෂ්ඨයේ දැක්වෙන 1988 නව ඒකාබද්ධ වැටුප් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන්නේ 1988 නොවැම්බර් මස 01 වෙනි දින සිට වන අතර, 1988.01.01 සිට 1988.10.31 තෙක් ගෙවිය යුත්තේ, මෙම චක්‍රලේඛයෙහි IV පරිශිෂ්ඨයේ දැක්වෙන පරිවර්තන ක්‍රම අනුව ගණන් බලන ලද අර්ධ වැඩිවීම පමණි."

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.387 හිද, එහි පරිශිෂ්ඨයන්හිද, අර්ධ වැඩිවීම ගෙවිය හැකි වන්නේ යම් දිනයක් දක්වාද යන්න සම්බන්ධයෙන් 1988.12.31 දිනය යෙදී ඇති සෑම ස්ථානයකම 1988.10.31 වශයෙන්ද, සම්පූර්ණ වැඩිවීම ගෙවිය හැකි වන්නේ යම් දිනයක සිටද යන්න සම්බන්ධයෙන් 1989.01.01 දිනය යෙදී ඇති සෑම ස්ථානයකම 1988.11.01 වශයෙන්ද, සංශෝධනය විය යුතුය.

03. වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුවේ නිර්දේශයක් මත හෝ අමාත්‍ය මණ්ඩල තීරණයක් මත හෝ කිසියම් රාජ්‍ය සංස්ථාවක වැටුප් ප්‍රතිශෝධනය කර, 1988 වර්ෂය තුලදී අඩ වැඩිවීම පමණක් ගෙවීමට නියමව තිබුනේ නම්, එවැනි රාජ්‍ය සංස්ථාවකද 1988 නොවැම්බර් මස 01 දින සිට සම්පූර්ණ වැඩිවීම ගෙවිය හැකිය.

04. මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

පු/-01